# ජයලත් මනෝරත්න වේදිකා නාට්‍ය නිර්මාණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

ඩබ්. බී. එම්. ප්‍රනාන්දු [1]

ජයලත් මනෝරත්න සිංහල නාට්‍ය ක්ෂේත්‍රය පිළිබඳ අධ්‍යයනයේ දී කැපීපෙනෙන නිර්මාණකරුවෙකි. හෙතෙමෙ 80 දශකයේ සිට වේදිකා නාට්‍ය දොළොසක් නිර්මාණ කර ඇත. ඔහුගේ රංගනය හා නාට්‍ය නිෂ්පාදන පිළිබඳ ව යම් යම් අවස්ථාවල දී බොහෝ විද්වතුන් හා විචාරකයන් අදහස් දක්වා ඇතත් සමස්ත නාට්‍ය නිර්මාණ පිළිබඳ ව කෙරුණු අධ්‍යයන දුර්ලභ ය. අභිනය සඟරාවේ 10 වැනි කලාපය ඔහුගේ නිර්මාණ පිළිබඳ ව සඳහන් වුවත් වර්තමාන නිර්මාණ දක්වා සමස්ත අධ්‍යයනයක් සිදු වී නොමැත. නිර්මාණකරුවකු ලෙස ඔහුගේ නිර්මාණාත්මක ප්‍රයුක්ජනයෙන් ප්‍රේක්ෂකයා වෙත පිරිනැමුණු ආකල්ප හා නාට්‍ය ක්ෂේත්‍රයේ ඔහුගේ අනන්‍යතා ව කෙබඳු ද යන්න සම්බන්ධය අධ්‍යයනයක් සිදු වී නොමැති බැවින් ඒ පිළිබඳ ව අධ්‍යයනය වැදගත් විය. ප්‍රාථමික මූලාශ්‍රය ලෙස නාට්‍ය පෙළ හා සම්මුඛ සාකච්ඡා දැක්විය හැකි අතර ද්විතීයික මූලාශ්‍රය වනුයේ පුස්තකාලය පරිශීලනය යි. තෘතීයික මූලාශ්‍රය වශයෙන් වාර සඟරා, පුවත්පත්, අන්තර්ජාලය දැක්වීමට පළිවන. ප්‍රවීණ රංගධරයකු ලෙස ජයලත් මනෝරත්න දෘශ්‍ය සාහිත්‍යාංගයෙන් ලත් අද්දැකීම් උපයෝගි කරගනිමින් වේදිකා නාට්‍ය නිෂ්පාදනය කළ නිර්මාණකරුවෙකි. නාට්‍ය නිර්මාණ බිහි කිරීමේ දී ඔහු විසින් සමාජීය ප්‍රස්තුත නාට්‍ය සඳහා යොදාගැනිණි. නිර්මාණයක් මඟින් ප්‍රේක්ෂකයා ආනන්දයෙන් ප්‍රඥාව කරාගෙන යා යුතු ය යන්න සිහි කරවමින් හෙතෙමෙ නාට්‍ය නිෂ්පාදන බිහි කළේ ය. පෙර-අපර දෙදිග නාට්‍ය රංග ශෛලීන් ඇසුරු කරමින් නාට්‍ය නිර්මාණය කළ ද ස්වකීය නිර්මාණවල මනෝරත්න ලකුණ සටහන් කිරීමට උත්සාහ ගත් නිර්මාණ කරුවකු ලෙස ඔහු සඳහන් කළ හැකි ය. සමාජ ශෝධනයක් හැම විට ම බලාපොරොත්තුවෙන් සිටින නිර්මාණකරුවකු බව ඔහුගේ නාට්‍ය නිර්මාණයන් දක්නට ඇති සමාජ විවේචනවලින් වටහාගැනීමට පිළිවන. එය වස්තු විෂය, රංග ශෛලීය, නාට්‍ය ආකෘතිය, චරිත නිරූපණය, භාෂාව හා නාට්‍ය දෘෂ්ටිය යන නාට්‍ය අංග ලක්ෂණ උපයෝගි කරගත් ආකාරයෙන් ද වඩාත් පැහැදිලි වේ. මෙසේ සමාජ විවේචන ඉදිරිපත් කිරීම මත ඇතැම් විට නිර්මාණාත්මක අංග ලක්ෂණ බැහැර වූ අවස්ථා ද දක්නට ඇත.

**ප්‍රමුඛ පදඃ** සිංහල නාට්‍ය, රංග ශෛලීය, නාට්‍ය ආකෘතිය, චරිත නිරූපණය, සමාජීය ප්‍රස්තුත

[1] සිංහල අධ්‍යයනාංශය